සංක්‍රමණිකයකුගේ සටහන

චුවින්ගම් ප්‍රශ්නය

නායකත්වය පිළිබඳ ගැටළුවක් මතුවුණා. කථා කළා. කැමැත්ත විමසුවා. ආසන්න කියා ඡන්ද ආවා. එපමණයි. පෙළපාලි නැහැ. පිකටින් නැහැ. නඩු නැහැ. තීන්දුව පැසෙනදිලියි. මෙහෙම ලියේ යූ.එන්.පී. එකක් අර්බුදය මධ්‍යකරුවන්ට තව මරමින් බුදින අහරක් යේ වී ඇති නිසයි. ලියාලා දැන් මුකුත් ඉතිරි වෙලා නැහැ. හරියට චුවින්ගම් එකත් මගේ රසක් නැති උතුරේ හප හපා ඉන්නේ. ඒත් ප්‍රශ්නෙ එතනයි. අපේ රටේ හැමදේටම පොල්මගකාර උරුමකක්‍රයන් සිටීම තමයි බොහෝ ප්‍රශ්නවලට මුල් හේතුව වන්නේ. මොනම ක්ෂේත්‍රයක වුවත් දක්ෂයාට ඉඩක් නැහැ. අහම්බයක් මිස. මගින්ද නැති උනොත් ශ්‍රී ලංකා එකරාත් ඔය සෙනේම තමයි. ගිය පාර ජ.වි.පේ. එක නිසා බේරුණා. ප්‍රණාවත් විරුද්ධ පක්ෂයක් නැති තැන අවංක රාජ්‍ය පාලනයක් ඇති වෙයිද? කෙතරම් බේදජනක තත්ත්වයක්ද මේ...

ගුප්තය

ගැහිල්ලේ කෙළවරකුත් නැහැ. මැරිල්ලේ කෙළවරකුත් නැහැ. මොනව වෙනවද, මොනවා කරනවද කියලා හිඟස්වත දැනුමක් කාටවත් නැහැ. කොටසක් හොඳටා, තව කොටසක් ගහනකොට ගහනවා, තවත් කොටසක් හැංගි හැංගි එළව එළවා ගහනවා. ප්‍රභාත් ගහනවා, මගින්දත් ගහනවා, කරුණාත් ගහනවා මේකේ කෙළවර කොතනද? විසඳුම කුමක්ද? පිළිතුරක් ජනතා න්‍යාය පත්‍රයෙන් නැද්ද, මගින්ද චින්තනේත් නැද්ද? විසඳුම ඉන්දිය මොඩලයද? ලාංකික මොඩලයද, සන්දිය ක්‍රමයද, එක්සත් ක්‍රමයද?, ජෙඩරල් ක්‍රමයද, ඒකියද මොකද්ද? මේකට හිඟස්වත පිළිතුරක් අත්තනෙම නැද්ද?. ජාතික ධනයත් තරුණ ජීවිතත් විනාශ කරමින් අතිශ්‍ය කර ගනිමින් අප මේ ඉඩ කරන්න් කාගේ අවශ්‍යතාවයක්ද? තව කොපමණ කලක්, දුරක් අපට මෙසේ මේ ගමන යා හැකි වේද?

සෝමිත පුතා

තුන්වන ලෝකයේ පමණක් නොව ලොව ධනවත් රටවල පවා දේශපාලන නායකයින් තම දරුවන් පුරුදු පුහුණු කරන්නේ තමන්ගේ අසවසමෙන් බලය, ධනය හා ජනතාව පාලනය කිරීම සඳහාය. එය රාජ්‍ය නායකයින්ට පමණක් නොව තුස්තවාදී සංවිධාන නායකයින් වන ප්‍රභාකරන්ටත්, තමිල් ලෙළුවන්ටත් පොදු වූවත්. තෙතුවක් පැවැති මේ සම්ප්‍රදායෙන් පිට පැනීමට යෝමිත රාජපක්ෂට තිබූ ආත්ම ශක්තිය අපි අගය කළ යුතුයි. රාජ්‍ය නායකයා ලෙස එයට අනුමතිය දීමට තරම් එඩියක් මගින්ද රාජපක්ෂට තිබීම ගැන ජනතා ප්‍රසාදය ඔහුට ගිම්වෙනවා ඇති. කෙසේ වෙතත් යෝමිතගේ සම්මුඛ පරීක්ෂණ කටයුතු, ඉරිදා යෝගතාවන් පිළිබඳ පරීක්ෂණවලට අදාළ ඡායාරූප දිගින් දිගට පුවත්පත්වල පළවීම එතරම් යෝග්‍ය නැහැ. එය මනුෂ්‍ය ගෞරවයිමේ වටිනාකම අඩු කර දැන්නත් වුණා. ඔය පරීක්ෂණවලට දඉස් ගන්න තරුණයන් සහභාගි වෙන්න ඇති. කෙදිනකවත් ඒවා මාධ්‍යයෙහි පළවුනොද? ගෞතම් නාවින හමුදා සීමාව තුළ එක් සෙබළෙක් පමණක් මිස ජනාධිපති පුත්‍රයා නොවේ. එසේම මේ තීරණය වඩාත් වටිනවත් වනු ඇත්තේ ඔහු නියමිත පුහුණුවෙන් පසු මුළුස්ථාන රාජකාරිවලට සීමා නොවී ක්‍රියාත්මක රාජකාරිවලට සහභාගි වූවොත් පමණි. යෝමිත ඔබට ජය.

නත්තල්

නත්තල් සුපුරුදු ලෙසම එළඹෙමින් පවතිනවා. නත්තල් සමග සිතිවෙන අදහස් තම නම් ගැන දේසිළුන් ජයකොඩි පියතුමායි. (ක්‍රිස්තුතුමා ඇරුන කොට) ''මගේ නත්තල් නම් දුගියා බත් කන දාය'' යැයි කීවේ එතුමායි. නත්තලේ තියම අරුත වාතිකරණයට යටපත්වීම පිළිබඳ ඔසේවිල්ලත් දැන් සාමාන්‍ය දෙයක් වෙලා. නත්තලට පල්ලි යාම හා වෙනස් දාට පන්සල් යාම අතර වැඩි වෙනසක් නැහැ. මිනිසුන්ගේ චින්පිළිවෙත් වල ඇති වී ඇති විපර්යාසයන් ගැන කුමට කථාද? රටක් පොදුවේ පරිහානියට යනකොට ආගමකට ඉන් මිදෙන්න ඉඩක් නැහැ. ඒ අනුව තමයි බෞද්ධ යටයුතුවල මුල් පුටු සුමතිපාලලෙවත්, එදිරිසිංහලාවත් කතෝලික මුල් පුටු කොතලාවලලෙවත් හිමිවෙන්නේ.

ඒ කෙසේ වෙතත් දහක ගණනාවක් තිස්සේ ළතාගේ ''නමෝපරියනි'' හා අනිල් ගේ ''බෙත්ලෙහෙම් පුරේ'' න් එහාට නොතිය ජාතියක කොටස්කරුවන් වන අපගේ මෙල්බර්න් කතෝලික සංගමය මගින් පසුගියදා හැමිටන් පාක් හි සංවිධානය කරන ලද නත්තල් කැරොල් ගී ප්‍රසංගය නම් ප්‍රශස්ථ මේටමක තිබුණා. දහසක් දුක්කරතාවයන් මදද වුවද අපගේ හදට නත්තල් සිසිල සමග අරුත මතක් කරමින් ඒ රාත්‍රිය සැබවින්ම අරිටන්මිත වුවක් වුණා. වෙනස් දෙයක් කිරීමට උත්සාහ කරන මිනිසුන් දැකීමත් සතුටක්.

සමුගත් රමණී

රමණී ලියනාරච්චි සොයුරිය අපෙන් සමුගෙන ගියිත්. අයගේ කියන යාම ඇසුණු මොහොතේ දැන්නා හඳුනන බොහෝ දෙනා පළකළ අදහස් නිසා මතකයට නැගුණේ හිකොලායි සිත්තුවොස්කි ගේ 'වොන් පන්තය'ගි එන වදනක්. එහම 'පිළිතය යනු මිනිසා සතු අති උතුම්ම වස්තුවයි. සිය ජීවිත කාලය තුළ මානව සංහතියේ දියුණුව වෙනුවෙන් තම යුතුකම් කොටස ඉටු කළා යැයි සතුටු විය හැකි මම, ඊට වඩා සැපතක් ලොව නැති බව'යි.

මා අයය පෞද්ගලිකව නොහඳුනන නමුත් අයය වෙනුවෙන් මේ සටහන තැබීමට මා සිතුවේ එබැවිනි. කොහෝ දෙනා දන්නා අයය හා ඇගේ ක්‍රියාකාරකම් පිළිබඳව යළි යළිත් සටහන් තැබීම අනවශ්‍ය යැයි මට හැඟුණේ අයගේ අවමංගල්‍ය උළෙලට ලැබුණු ජනතා ප්‍රණාමය නිසාය. ජනතාව හොඳ මිනිසුන් හඳුනා ගන්නේ, තරු කරන්නේ ඉවෙන් මෙනි. එයට දන්නා හඳුනනකම්, අඒ වැසි පිසා වැදගත් වන්නේ නැත. ඉරිදු සවස මා අත් දුටුවේ එයයි.

සොයුරිය, ඔබට ජනතා හදවතේ සද රැඳී සිටීමේ නිවන ලැබී ඇති බැවින් වෙනත් නිවනක් ඔා පතන්නේ නැත.

2004 මාර්තු මාසයේ නිවාවුවක් සඳහා ශ්‍රීලංකාවට ගිය මම දඹදිව වන්දනා චාරිකාවකට සහභාගි වීමි. ඊට පෙර, ප්‍රවීන ලේඛක ධර්මසිරි ගමගේ මහතා විසින් රචිත දඹදිව චාරිකා පොතඳ ආනාවෙන් කියැවීමි. දඹදිව බුදුන් වහන්සේ වැඩ සිටි ස්ථාන වලදී උන්වහන්සේ පිළිබඳව වැඩ සිටින ආකාරය පාඨකයන්ගේ සිත් තුළ මවා තිබීණි. ඒ අපූර්ව අත්දැකීම ලබාගැනීමේ නොතිත් ආශාවකින් මාද චාරිකාවට එක්වූවේ.

එහෙත් අවාසනාවකට මෙන් බුදුන් වහන්සේ වැඩ සිටි බොහෝ ස්ථාන වලදී මනසින් උන්වහන්සේ මවා ගන්නට මම අපපොහොසත් වීමි. දැන් ඔය විත්වතුන් ගෙනා පූජා භාණ්ඩ මෙම ස්ථානයේ තැන්තන් කරලා ඉරාගෙන් වාඩි වෙන්න එක් සිද්ධස්ථානයක අධිපති ස්වামීන් වහන්සේ කියා සිටියහ. දඹදිව ඇති ශ්‍රීලංකික පන්සල්වල හඩන්තුවට සහ හික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා ආධාර හා පූජා භාණ්ඩ රැගෙන යාම අපේ බැතිමතුන්ගේ සිරිතයි. ඉල්ලුවන් නැතත් ඒවා පූජාකර එනවා මිස, ආපසු අරන් එන කෙනෙකු නැත.

අපේ බුදුරජාණන් වහන්සේ ජාති ආහම් කුල භේද නොතකා දම් අමා පැන් බෙදූ ආකාරයටම මේ ටිබෙට් හාමුදුරුවෝ විඩාපත්ව තමා වෙත එන වන්දනා කරුවන්ට අමා පැන් බෙදා දෙති.

අනුන්ගෙන් අඩමල් වේනුවක් තරම්වත් බලාපොරොත්තු නොවූ අපේ තථාගතයන් වන්නේ එම ස්ථානයේදී සිතින් මොගන්නට මට නම් කොහෙත්ම හැකියාවක් නොවීය.

2004 මාර්තු මාසය ශ්‍රීලංකාව මහ ඇතිවරණය සූදානම් වෙමින් සිටි කාලයයි. ඇතිවරණ උණුසුම දඹදිව සිද්ධස්ථාන වලටද නදිනම් පැතිරී තිබීණි. ඇතැම් ස්වාමීන් වහන්සේලා සිය ධර්ම දේශනාවේ කොටසක් හැර්යිට එක්තරා දේශපාලන පක්ෂයකට ගිතවත්ව අනුශාසනා පැවැත්වූහ. දඹදිව ප්‍රධානතම සිද්ධස්ථානයකදී බැතිමතුන් ඇමතූ එක් ස්වාමීන් වහන්සේ තමන් ලංකාවේ නාමුවුරුවන් නියෝජනය කරන පක්ෂයේ ජන්දය දෙන්නෑ යි කෙලින්ම කියා සිටියහ. ඇතිවරණ උණුසුමින් රත්වූ ඒ පින් බිම්මේ කරුණා සිතල හදින් යුතු අපේ බුදුරජාණන් වහන්සේ දැකගන්නට නොවීය.

තවත් එක් ප්‍රසිද්ධ ඊශ්‍රාරස්ථානයක පිරිත් දේශනයක් පැවැත්වීණ. ශ්‍රීලංකික වන්දනා කරුවන් දහසකගෙන් පමණ ශාලාව අතුරු සිදුරු නැතිව පිරී තිබුණු එම මොහොත ආගමික භක්තිය දනවන වටිනා අවස්ථාවක් වීය. එහෙත් පිරිත් දේශනය අවසානයේ සිදුවූයේ කුමක්ද? පිරිත් දේශනා කරන අවස්ථාවේ එම වේදිකාව මත නොවූ බෝතල් කළ වතුර පෙට්ටියක් වේදිකාව මතට ගෙනවුත් එම බෝතල් වටා පිරිත් නූල දවටා තබා, බෝතලය රූපියල් දහය බැගින් බැතිමතුනට විකිණීමයි. පිරිනේ බලය පිරිත් නූල හරහා වතුර බෝතලයට යැවීමේ මහා ප්‍රාතිහාර්යය දැක බලාගන්නට අනේ බුදු හාමුදුරුවනේ! ඔබ වහන්සේ එම ස්ථානයේ වැඩ නොසිටි එක හොඳය.

ඊලගට අප ගියේ බෝසතාණන් වහන්සේ සය අවුරුද්දක් ලුප්තර ක්‍රියා කළ දුර්ගේශ්වරී කඳු මුදුනටයි. මේ කඳු මුදුනට

දඹදිවදී බුදුන් දැකීම

ශ්‍රියානි පෙරේරා

ළඟාවීය හැක්කේ ඉතා දුෂ්කර ගමනකින් පසුවය. හැරමිටි වාරවෙන් හෝ දනිපති ගාගෙන හෝ කඳු මුදුනට ළඟාවනවිට බැතිමතුන් නොසැහෙන්නට ගෙම්බන්වී හමාය. කඳු මුදුනේ පුංචි පන්සලේ වැඩසිටින්නේ ටිබෙට් ජාතික ස්වාමීන් වහන්සේ නමකි. උන්වහන්සේගේ පිළිවතයද දුර්ගේශ්වරිය මෙන්ම කලුකය. එහෙත් උන්වහන්සේගන් ලැබෙන බෙලිමල් වතුර පිය නම් දුර්ගේශ්වරිය තරුණය කළ සෑම බෞද්ධයෙකුටම අමෘත පානයක් වන බව නිසැකය.

දුර්ගේශ්වරී කන්ද

අපේ බුදුරජාණන් වහන්සේ ජාති ආහම් කුල භේද නොතකා දම් අමා පැන් බෙදූ ආකාරයටම මේ ටිබෙට් හාමුදුරුවෝ විඩාපත්ව තමා වෙත එන වන්දනා කරුවන්ට අමා පැන් බෙදා දෙති. උන් වහන්සේ අපට දෙසූ දහමක් නැත. කියූ පිරිතකුත් නැත. එහෙත්, තමා වෙත එන්නවුන්ගේ දුක හඳුනාගැනීමේ බෝසත් ගුණය උන් වහන්සේ තුළ තිබීණ.

වන්දනා ඩඩයක් දුර්ගය තරණය කරගෙන එනවා දුරදිම දකින හාමුදුරුවෝ වතුර හැලියක් පැහෙන්නට තබති. ඒ හැඩි එන්නේ මොන රටේ මිනිසුන්දැයි සොයා බැලීමක් නැත. ඔවුන් අතේ පූජා භාණ්ඩ තිබෙනවාදැයි දුරට පෙනෙන්නේද නැත. කණ්ඩායමේ අනේවිධ සිරාණන්, විහාරා මහෝපාසිකාවන් මෙන්ම ඇගුළිමාලයන් හා ච්චමාතවීකාවන් සිටිනවා වෙන්නටද පුළුවන. ඒ කාටත් සමයේ, මෙත් සිතින් බෙදා දෙන්නට පන්සල මිදුලේ බෙලිමල් වතුර පිළියෙල වෙන සැටි දැකිනවිට මගේ සිතට නැගුණේ ලංකාවේදී අසා පුරාවදු ගියයි. බුදු හාමුදුරුවො වැඩියා වාගෙයි පින්බර සුවාමිනේ!

දුර්ගේශ්වරී කඳු මුදුනේ එසේ පීවමාන වූයේ කුසගින්නේ සිටි අයෙකුට බණ

30 පිටට